අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/07/08/01 වෙළු V

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.10.

............................................. මයා/මිය/මෙය සම්මුඛ පරීක්ෂණ අංකය : .................................

.............................................

.............................................

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරු සඳහා පත් කිරිමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම.</u>**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ 11.2.2ට අනුව පවත්වනු ලබන I ශ්‍රේණියේ නිලධාරින් තනතුරු සඳහා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ සඳහා බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 04 වන මහල කමිටු ශාලාවේදී 2024 .............වන දින පෙ.ව/ප.ව .................... ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අදාළ සහතිකවල ඡායා පිටපත් වෙන වෙනම ( අංක I සිට X දක්වා ලේඛන ) ගොනු දෙක (02)ක් පහත සඳහන් අනුපිළිවෙලට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. සියලුම ලිපි ලේඛන එදිනම ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත් පිළිබඳව සලකා බැලීමක් සිදු නොකෙරේ.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය.
II. උප්පැන්න සහතිකය ( නමෙහි වෙනසක් පවතීනම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්)
III. ජාතික හැඳුනුම්පත
IV. සේවා පළපුරුද්ද සනාථ කිරිම සඳහා
    a) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පත්වීම් ලිපිය
    b) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපෙනඥ සේවයේ සේවය ස්ථිර කිරීමේ ලිපිය
    c) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II පන්තියට උසස් කිරීමේ ලිපිය
    d) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I පන්තියට උසස් කිරීමේ ලිපිය
    e) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I පන්තියට/ I ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
V. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 03 වන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමට අදාල වන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

VI. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට පත් වූ දින සිට 2024.07.12/2024.09.06 දින දක්වා සතුටුදායක සේවා කාලයක් පවතින බවටත්, මුළු සේවා කාලය තුළ විනය දඬුවමකට ලක් වී නොමැති බවටත්, වැටුප් වර්ධක සියල්ල උපායාගෙන ඇති බවටත්, වැටුප් රහිත නිවාඩු නොලැබූ බවටත්, නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සියල්ලෙන්ම සමත් වී ඇති බවටත්, ප්‍රධාන කොමසාරිස්/පීඨාධිපති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන සහතිකය. (ඇමුණුම 01)

VII. අතිරේක අධ්‍යාපන සුදුසුකම් - අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පරිපාටියේ අනු අංක 02 යටතේ වූ සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික.

VIII. ලකුණු පරිපාටියේ අංක 04 යටතේ තොරතුරු සන්නිවේදන දැනුම පිළිබඳ ලබා ඇති සහතික.

සටහන :

1. සහතික පත්‍රයන්හි පාඨමාලා කාලය සඳහන් නොවේ නම් එම කාලය සනාථ කිරීම සඳහා අදාළ ආයතනයෙන් ලබා ගත් ලිපියක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

2. විදේශීය විශ්වවිද්‍යාල මඟින් ලබා ගන්නා උපාධි සහතික සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් යන්න තහවුරු කිරීමට අදාළ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

IX. ලකුණු පරිපාටියේ අංක 05 යටතේ පහත සුදුසුකම් සනාථ කිරීම සඳහා,

   a. ලකුණු පරිපාටියේ අංක 5.1 හි සඳහන් පරිදි අධ්‍යාපන ලේකම්/ ප්‍රධාන කොමසාරිස් විසින් නිකුත් කර ඇති හෝ රජයේ පිළිගත්/රජයේ අනුබද්ධිත ආයතනයක් හෝ රජයේ පිළිගත් ජාත්‍යන්තර ආයතනයකින් නිකුත් කරන ලද සහතික
   b. අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා සහතික.

සටහන : ලකුණු පරිපාටියෙහි 5.1 යටතේ සඳහන් කර ඇති පරිදි අදාළ සහතික තහවුරු කළ හැකි ලේඛන ඔබ විසින් ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු, ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)ය.

X. පර්යේෂණ හා ප්‍රකාශන

   a. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පරිපාටියේ අංක 06 යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන පර්යේෂණ හා ප්‍රකාශවල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමේ දී එම පර්යේෂණ/ ප්‍රකාශනය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුව/පිටු එම පර්යේෂණය/කෘතිය/ප්‍රකාශනවල ඔබගේ නම සඳහන් වන පිටුව/ පිටුවල සහතික කරන ලද පිටපත් සමඟ අදාළ පර්යේෂණ හා ප්‍රකාශනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

04. සන්ධාන භාෂා ප්‍රවීණතාවය,

I. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ලබා දෙනු ලබන මාතෘකා කිහිපයක් අතුරින් අහඹු ලෙස තෝරා ගනු ලබන මාතෘකාවක් යටතේ මිනිත්තු 03ක කාලයක ඉදිරිපත් කිරීමක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කළ යුතුය.

II. එම ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වීමට ඔබට මිනිත්තු 20ක කාලයක් ලබා දෙනු ලැබේ.

III. එම ඉදිරිපත් කිරීම පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

a) විෂයය අන්තර්ගතය - ලකුණු 02
b) ඉදිරිපත් කරන විලාසය - ලකුණු 02
c) භාෂාව හැසිරවීම - ලකුණු 02

5. සම්මුඛ පරීක්ෂණයේ දී ඔබ දක්වනු ලබන සමස්ථ කුසලතාවය හා පෞරුෂත්වය වෙනුවෙන් ඔබට උපරිම ලකුණු 05ක් ප්‍රදානය කරනු ලැබේ.

6. සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

7. සම්මුඛ පරීක්ෂණයේදි ඔබ විසින් දක්වනු ලබන කාර්ය සාධනය හා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව උපයාගනු ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ථ කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව පමණක් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පීඨාධිපති/උප පීඨාධිපති/විදුහල්පති තනතුරු සඳහා පත් කරනු ලැබීම සිදු වේ.

8. මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවීම හෝ පෙනී සිටීම පමණක් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පීඨාධිපති/උප පීඨාධිපති/විදුහල්පති තනතුරක් ලැබීමට හිමිකමක් නොවන බව කාරුණිකව දන්වමි.

අත්.කලේ/ ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්

ආර්.ජී.ඩී. ජමින්ද
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
( අධ්‍යාපන සේවා ආයතන)

**අවධානයට :** මෙම ලිපිය ලද බව සතියේ දිනයන්හි රාජකාරි වේලාව තුළ 0112-787083 යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දී තහවුරු කරන්නේ නම් මැනවි.

..

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
II. උප්පැන්න සහතිකය
III. ජාතික හැඳුනුම්පත
IV. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියේ / 2-II ශ්‍රේණියේ ස්ථිර කිරීමේ ලිපිය
V. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2- I ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය
VI. අධ්‍යාපන සුදුසුකම්
   a) ගැසට් නිවේදනයේ අංක 05 යටතේ සුදුසුකම් සනාථ කිරිම සඳහා වු සහතික.
      උපාධි සහතික සමග විස්තරාත්මක උපාධි සහතික/පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතික / විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සහතික.
   b) උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේනම් අ.පො.ස. (සා.පෙළ) සහතිකය හෝ ඊට සමාන විභාගයකදි ඉංග්‍රිසි භාෂාව/ ඉංග්‍රිසි සාහිත්‍ය සඳහා සම්මාන සමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක්.

02. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක සේවය කරන්නේ නම් පීඨාධිපතිගේ ද ගුරු විද්‍යාලයක හෝ ගුරු මධ්‍යස්ථානයක සේවය කරන්නේනම් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ද අත්සනින් යුතුව, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියට උසස් වූ දින සිට 2015.07.01 දින දක්වා කාලය සඳහා සකස් කරන ලද ඇමුණුම 01 හි වාර්තාව පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කර මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් සහතික පත්වල මුල් පිටපත් ද රැගෙන පැමිණිය යුතුය.

I. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ උපලේඛනගත තනතුරක වසර 05 ක් සම්පූර්ණ කර ඇති බවට සේවා සහතිකය.
II. විශ්‍රාම ලබා ඇත්නම් එම ලිපිය.
III. අතිරේක සුදුසුකම් සඳහා අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ සඳහන් ලකුණු පටිපාටිය යටතේ ලකුණු ලබාදීමට අදාළ වන සහතික හා ලිපි ලේඛන.
   a) උසස්වීම සඳහා අදාළ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති උපාධි සහතික/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික/ පශ්චාත් උපාධි සහතික
   b) ඉංග්‍රීසි භාෂා නිපුණතාවයට අදාළ සහතික

c) දෙවන භාෂා සන්නිවේදන හැකියාවට අදාළ සහතික

d) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම පිළිබඳ ලබා ඇති සහතික

e) අධ්‍යාපන ලේකම් හෝ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) හෝ විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතිය අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම්

(ගැසට් නිවේදනයේ ලකුණු පටිපාටිය අනුව, කිසියම් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සඳහා ලකුණු ලබා දෙනුයේ එහි කාල සීමාව අදාළ සහතිකයේ සඳහන්ව ඇත්නම් හෝ අදාළ ආයතනයෙන් කාල සිමාව පිළිබඳව සහතිකයක් ලබා දී ඇත්නම් පමණි)

04. ඔබේ නම සහ කැඳවීම් අංකය සටහන් කරන ලද ගොනුවක ඉහත සඳහන් අනුපිළිවෙලට සකස් කරන ලද සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් ඇතුළත් කර, එදිනට රැගෙන ආ යුතු අතර මෙම සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගිවීම උසස්වීම ලබා ගැනීමට හිමිකමක් නොවන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

අනූෂා බටවල ගමගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

ඇමුණුම 01

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පැරණි සේවා ව්‍යවස්ථාව අනුව
## 2-I ශ්‍රේණිය නිලධාරීන්1 පන්තියට උසස් කිරීම

නිලධාරියාගේ නම : ...............................................................................................

තනතුර : .................................................

සේවා ස්ථානය : ...............................................................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ පීඨාධිපති මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු

01. ........................................................... මහතා/ මහත්මිය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියට උසස් වූ ........................... දින සිට 2015.07.01 දින දක්වා කාලය තුළ, සක්‍රීය හා සතුටුදායක

සේවා කාලයක් සම්පූර්ණ කර ........... (ඇති/නැති) අතර වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ........... (ඇත/නැත)

* වැටුප් වර්ධක විලම්භනය වී ඇත්නම් එම දිනය හා ඊට හේතුව පහත සඳහන් කරන්න.

..............................................................................................................................................

02. වැටුප් රහිත නිවාඩු ලබා තිබේද? (ඔව්/නැත) : ...............

අඩ වැටුප් සහිත නිවාඩු ලබා තිබේද? (ඔව්/නැත) : ...............

- වැටුප් රහිත/ අඩ වැටුප් සහිත නිවාඩු ලබා තිබේනම් ඒ පිළිබඳ තොරතුරු (මෙම වගුව සම්පූර්ණ කරන්න)

| කාල පරිච්ඡේදය | වැටුප් රහිත නිවාඩු කාලය | අඩ වැටුප් සහිත නිවාඩු කාලය |
|---|---|---|
| 2014.07.02-2015.07.01 | | |
| 2013.07.02-2014.07.01 | | |
| 2012.07.02-2013.07.01 | | |
| 2011.07.02-2012.07.01 | | |
| 2010.07.02-2011.07.01 | | |
| 2009.07.02-2010.07.01 | | |

03. විනය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේනම් හෝ විගණන/විමර්ශන තොරතුරු තිබේනම් එම තොරතුරු (මෙම වගුව සම්පූර්ණ කරන්න)

| කාල පරිච්ඡේදය | විනය ක්‍රියාමාර්ගය | විගණන / විමර්ශන තත්ත්වය |
|---|---|---|
| 2014.07.02-2015.07.01 | | |
| 2013.07.02-2014.07.01 | | |
| 2012.07.02-2013.07.01 | | |
| 2011.07.02-2012.07.01 | | |
| 2010.07.02-2011.07.01 | | |
| 2009.07.02-2010.07.01 | | |

ඉහත සඳහන් තොරතුරු මෙම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

දිනය : ......................          කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ පීඨාධිපති : .......................................

(අත්සන සහ නිල මුද්‍රාව)